ශ්‍රී ලංකාව

# විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව

ආයතන චක්‍රලේඛ ලිපි අංක: 06/2014

නො. 20, වෝඩ් පෙදෙස,
කොළඹ 07
2014, මාර්තු මස 26 වන දින.

උපකුලපතිවරුන්
මණ්ඩපාධිපතිවරුන්
ආයතන අධ්‍යක්ෂවරුන්

## සංග්‍රහ වියදම් සඳහා ගෙවීම

සංග්‍රහ දීමනා ප්‍රතිපූර්ණය කිරීම වෙනුවෙන් නිකුත් කර ඇති 1979.03.14 දිනැති කොමිෂන් සභා චක්‍රලේඛ අංක 07 , 1979.04.23 දිනැති අංක 18 , 1979.08.17 දිනැති අංක 31 , 1982.05.18 දිනැති අංක 172 , 1984.08.01 දිනැති අංක 265 , 1984.11.05 දිනැති අංක 278 , 1984.12.04 දිනැති අංක 284, 1987.07.02 දිනැති අංක 350 , 1988.04.06 දිනැති අංක 364 , 1991.10.01 දිනැති අංක 491 සහ 1992.03.09 දිනැති අංක 508 කෙරෙහි ඔබගේ කාරුණික අවධානය යොමු කරවමි.

2013.10.10, 2014.01.06 සහ 2014.03.05 දිනයන්හි රැස්වූ 882, 887, සහ 890 වැනි විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා රැස්වීම් වාර වලදී, 2014.01.01 දින සිට උක්ත දීමනාව "සංග්‍රහ වියදම් සඳහා ගෙවීම්" යනුවෙන් නැවත නම් කිරීමටත් පවත්නා දීමනා පහත පරිදි වැඩි කිරීමටත් තීරණය කරන ලදී.

| තනතුර | සංශෝධිත දීමනාව මාසික මූලික වැටුපේ ප්‍රතිශතයක් ලෙස (රු.) |
|---|---|
| සභාපති/ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව | 20% |
| උප සභාපති/ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව | 15% |
| උපකුලපති | 15% |
| ලේකම්/ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව | 12% |
| මණ්ඩප වල මණ්ඩපාධිපති | 12% |
| ආයතන අධ්‍යක්ෂ | 12% |
| පීඨයක පීඨාධිපති | 10% |
| ලේඛකාධිකාරී / අතිරේක ලේකම් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව | 10% |
| අධ්‍යයන අංශ ප්‍රධානී | 8% |
| මූල්‍යාධිකාරිවරුන් හා ඒ හා සමාන ශ්‍රේණිවල සිටින නිලධාරීන් | 10% |

තවද, මෙම ගෙවීම සඳහා සුදුසුකම් ලබන නිලධාරීන් එකී ගෙවීම සඳහා බිල්පත් ඉදිරිපත් කිරීම අවශ්‍ය නොවන අතර එම සංග්‍රහ වියදම දරන ලද බවට තමා විසින් සහතික කරන ලද ප්‍රකාශයක් ඉදිරිපත් කිරීම මෙම ගෙවීම සඳහා ප්‍රමාණවත් වේ.

මෙම චක්‍රලේඛය ක්‍රියාත්මක වීමත් සමඟම කොමිෂන් සභා චක්‍රලේඛ අංක 18, 172, 278, 284, 350, 364, 491 හා 508 ත්,මේ සම්බන්ධයෙන් උපදෙස් ලබාදී ඇති කොමිෂන් සභා චක්‍රලේඛ අංක 07, 31, සහ 265 හි අදාල කොටස් ද අවලංගු වේ.

කරුණාකර ඒ අනුව කටයුතු කරන්න.

**අ/කළේ: මහාචාර්ය ක්ෂණිකා හිරිඹුරේගම**
සභාපතිනිය

පිටපත්:
1. ලේකම්/ උසස් අධ්‍යාපන අමාත්‍යාංශය
2. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපති කාර්යාලය
3. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ උප සභාපති
4. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සාමාජිකයින්
5. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ලේකම්
6. පීඨාධිපතිවරුන්
7. විශ්වවිද්‍යාල වල ලේඛකාධිකාරිවරුන්
8. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ගණකාධිකාරී
9. විශ්වවිද්‍යාල වල මුල්‍යාධිකාරීවරුන්
10. උසස් අධ්‍යාපන ආයතන වල පුස්තකාලයාධිපතිවරුන්/ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපතිවරුන් / සහකාර පුස්තකාලයාධිපතිවරුන්
11. උසස් අධ්‍යාපන ආයතන /මණ්ඩප වල නියෝජ්‍ය ලේඛකාධිකාරිවරුන්/ජ්‍යෙ.ස.ලේ /ස.ලේ
12. උසස් අධ්‍යාපන ආයතන /මණ්ඩප වල නියෝජ්‍ය මුල්‍යාධිකාරීවරුන්/ජ්‍යෙ.ස.මු/ස.මු
13. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ප්‍රධාන අභ්‍යන්තර විගණක
14. විශ්වවිද්‍යාල වල රජයේ විගණන අධිකාරිවරුන්
15. උසස් අධ්‍යාපන ආයතන වල ජ්‍යෙෂ්ඨ සහකාර අභ්‍යන්තර විගණකවරුන්/ ස.අ.වි
16. වෘත්තිය සමිතිවල ලේකම්වරුන්
17. විගණකාධිපති

ගොනු අංකය: යූ.ජී.සී./එච්.ආර්./6/1/5